**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජූලි 2017

## (AA25) ව්‍යාපාර නීතිය හා ආචාර ධර්ම

(Business Law and Ethics)

---

## A - කොටස

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය ලකුණු 20 සඳහා වන, වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න 10කින් සමන්විත විය.

අයදුම්කරුවන්ගෙන් බහුතරයක් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සහකර තිබිණි. මෙම ප්‍රශ්නයට වෙන්කර තිබූ සමස්ත ලකුණු සංඛ්‍යාවෙන් හරි අඩකට වඩා ලබා ගැනීමට බහුතරයක් සමත් වී තිබිණි.

ප්‍රශ්න අංක 1.5, 1.9 සහ 1.10 සඳහා පිළිතුරු සැපයීමට බොහෝමයක් අයදුම්කරුවන් අසමත් වී තිබූ බව දක්නට ලැබිණි.

ප්‍රශ්න අංක 1.5 සඳහා ඇතැම් අයදුම්කරුවන් වැරදි පිළිතුර සපයා තිබුනේ, ප්‍රශ්නයේ තිබූ **"නොවන්නේ"** යන වචනය නොදැකීම හේතුවෙනි. කෙසේවුවද, අයදුම්කරුවන් විසින්, භාණ්ඩ විකිණීමේ ආඥාපනතට අනුව ව්‍යංග කොන්දේසි සම්බන්ධයෙන් ප්‍රමාණවත් දැනුමක් වර්ධනය කර ගත යුතුය.

ප්‍රශ්න අංක 1.9 සඳහා ඇතැම් අයදුම්කරුවන් පුද්ගල නීතිය සහ ප්‍රාදේශීය නීතිය අතර වෙනස සඳහන් කිරීමට අසමත් වී තිබිණි. ඇතැම් අයදුම්කරුවන් මෙම නීතින් ද්විත්වය පටලවාගෙන තිබූ අතර, ඇතැම් අයදුම්කරුවන් පුද්ගල නීතිය සහ ප්‍රාදේශීය නීතිය අතර වෙනස සඳහන් නොකර හුදෙක් උදාහරණ පමණක් සපයා තිබිණි.

මෙය ඉතා සරල සහ ඍජු ප්‍රශ්නයක් වුවද, ප්‍රශ්න අංක 1.10 සඳහා බොහෝමයක් අයදුම්කරුවන් ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලයේ මූලික කාර්යයන් දෙකක් (2) සඳහන් කිරීමට අපොහොසත් වී තිබිණි.

A කොටස සමත්වීමේ ලකුණ කරා ලගාවීම සඳහා විශාල දායත්වයක් සපයන බැවින්, එම කොටස සඳහා ඉහළ ලකුණු ලබා ගැනීම පිණිස, අයදුම්කරුවන් සමස්ත විෂය නිර්දේශය පිළිබද හොඳ අවබෝධයක් තිබිය යුතුය.

**සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර සැපයීමේ මට්ටම සතුටුදායක වේ.**

## B කොටස

### ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නය <u>නියෝජ්‍යාත්ව නීතිය</u> මත පදනම් වී තිබිණි. සමහර අයදුම්කරුවන් දෙන ලද සිදුවීම තුල ප්‍රතිබන්ධනය මගින්, නියෝජ්‍යාත්වය නිර්මාණය වූ බව හඳුනාගෙන නොතිබිණි. ඇතැම් අයදුම්කරුවන් විසින් හේමාල් මිලදී ගත් ඉඩම සඳහා **A&B Ltd**. මුදල් ගෙවීම සඳහා වගකීමට යටත්වේද යන්න විස්තර නොකර, අපැහැදිලි ලෙස පිළිතුරු සපයා තිබිණි. තවද, අතලොස්සක් පමණ වූ අයදුම්කරුවන් විසින් හේමාල් මිලදී ගත් ඉඩම සඳහා **A&B Ltd**. මුදල් ගෙවීම සඳහා වගකීමට යටත්වේද යන්න පමණක් ලියා තිබූ අතර එකී පිළිතුර, දෙන ලද සිදුවීමේ සිද්ධිමය සාධක මත පදනම්ව තාර්කිකව සහ නිවැරදි න්‍යායාත්මක පදනමක් මත ගොඩනගා නොතිබූ බව දක්නට ලැබිණි.

**සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර සැපයීමේ මට්ටම යම් පමණකට සතුටුදායක වේ.**

## ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නය තුලින් ප්‍රායෝගික සිදුවීමක් හරහා ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර පිළිබඳව දැනුම පරීක්ෂා කිරීම බලාපොරොත්තු විය. බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට උත්සුක වී තිබූ අතර සතුටුදායක පිළිතුරු සපයා තිබිණි. අයදුම්කරුවන් ගණනාවක්, දෙන ලද සිදුවීම තුල චෙක්පතට අදාලව, බැංකුවේ වගකීම පිළිබඳව විස්තර නොකර, “ගනුදෙනු කළ නොහැකිය” යන වචන සහිතව චෙක්පත රේඛනය කිරීම පිළිබඳව විස්තර කර තිබිණි. ඇතැම් අයදුම්කරුවන්, ප්‍රශ්නය හරහා මෙම චෙක්පත සම්බන්ධයෙන් බැංකුවේ වගකීම පිළිබඳව සාකච්ඡා කිරීම අපේක්ෂා කළ බව අවබෝධකර නොගෙන, ධනපාලට එරෙහිව ධනසිරිගේ නෛතික අයිතිවාසිකම් සම්බන්ධයෙන් විස්තර කර තිබිණි.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන් උත්තර සැපයීමේ මට්ටම යම් පමණකට සතුටුදායක වේ.

## ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නය තුලින් ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම අපේක්ෂා කළේය. මෙම ප්‍රශ්නයේ (a) කොටසින් ජාත්‍යන්තර වෙළඳාමේදී භාවිත කෙරෙන ගෙවීම් ක්‍රම දෙකක් (2) සඳහන් කිරීම අපේක්ෂා කළ අතර එහි (b) කොටසින් එලෙස සඳහන් කරන ලද ජාත්‍යන්තර වෙළඳාමේදී යොදා ගනු ලබන ගෙවීම් ක්‍රම දෙකින් එක් ක්‍රමයක් පිළිබඳ විස්තර කිරීම අපේක්ෂා කරන ලදී. අයදුම්කරුවන්ගෙන් බහුතරයක්, මෙම ප්‍රශ්නයේ (a) කොටස සඳහා සාර්ථකව පිළිතුරු සපයා තිබූ නමුත් සමහර අයදුම්කරුවන්ගෙන්, ඉහත (a) කොටසේ සඳහන් කරන ලද එක් ගෙවීම් ක්‍රමයක් විස්තර කර නොතිබිණි. ඇතැම් අයදුම්කරුවන් (b) කොටස සඳහා අනවශ්‍ය විස්තර කිරීම් ලබා දී තිබිණි. ප්‍රශ්නය සඳහා වෙන්කර ඇති ලකුණු ප්‍රමාණයන්ගෙන් සැපයිය යුතු පිළිතුරු සඳහා මගපෙන්වීමක් ලබා ගැනීම වැදගත් වේ.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර සැපයීමේ මට්ටම සතුටුදායක වේ.

## ප්‍රශ්න අංක 05

මෙම ප්‍රශ්නය අයදුම්කරුවන්ගේ රක්ෂණ නීතියට අදාල දැනුම පරීක්ෂා කරන ලදී. අයදුම්කරුවන් විසින්, රක්ෂණය පිළිබඳ නීතියට අදාල සංකල්ප, සිද්ධිමය සාධක හරහා සාධාරණීකරණය කිරීමක් නොකර, හුදෙක් බිංදුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට රක්ෂණ සමාගමට හැකියාවක් තිබේද නැද්ද යන්න පමණක් සඳහන් කර තිබෙනු ඇතැම් අවස්ථාවන්හී දී දක්නට ලැබිණි. අයදුම්කරුවන් ගණනාවක් මෙම සිදුවීමට “උපරිම විශ්වාසය” නම් මූලධර්මය (uberrimae fidei) ආශ්‍රය කරගෙන නොතිබූ අතර රක්ෂණයට සම්බන්ධ සෙසු අදාල නොවන සංකල්පයන් අදාල කර ගෙන තිබේ. උත්තර සැපයීමට පෙර ප්‍රශ්නය මැනවින් අවබෝධකර ගැනීම ඉතාමත් වැදගත් වේ.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර සැපයීම හොඳ මට්ටමක පැවතුණි.

## ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නය වෘත්තීය ආචාර ධර්මයන්හී මූලික මූලධර්මයන් මත පදනම් වී තිබිණි. එහිදී (a) කොටසින්, වැඩකරන පරිසරයේ නිර්මාණය කර ඇති ආරක්ෂක විධිවිධාන දෙකක් (2) සහ (b ) කොටසින් වෘත්තීය, ව්‍යවස්ථාව සහ රෙගුලාසි මගින් නිර්මාණය කර ඇති ආරක්ෂක විධිවිධාන තුනක් (3) සඳහන් කිරීම අපේක්ෂා කරන ලදී. මෙහිදී ඇතැම් අයදුම්කරුවන් මෙම මාතෘකාව සම්බන්ධයෙන් දැනුවත්භාවයක් නොමැති බව දක්නට ලැබුන අතර කිසිසේත්ම අදාල නැති වැරදි උත්තර සපයා තිබූ දක්නට ලැබිණි. ප්‍රශ්නය තුල ‘සඳහන් කරන්න’ යන්න පැහැදිලිව දක්වා තිබුනද, ඇතැම් අයදුම්කරුවන් ආරක්ෂක විධිවිධාන සම්බන්ධයෙන් සවිස්තරාත්මක පිළිතුරු සපයා තිබිණි. ප්‍රශ්නය හරහා අපේක්ෂා කරන්නේ කුමක්ද යන්න, අයදුම්කරුවන් විසින් උත්තර සැපයීමට පෙර අවබෝධ කර ගත යුතුය.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන් උත්තර සැපයීමේ මට්ටම සතුටුදායක නොවේ.

C කොටස

## ප්‍රශ්න අංක 07

මෙය හවුල් ව්‍යාපාර සම්බන්ධ ඉතා සරළ ප්‍රශ්නයක් වූ අතර එක් හවුල්කරුවෙකුගේ වැරදි ක්‍රියාවක් සම්බන්ධයෙන් හවුල් ව්‍යාපාරයේ සෙසු හවුල්කරුවන්ගේ වගකීම පිළිබද සාකච්ඡා කිරීම අපේක්ෂා කරන ලදී. බොහෝ විභාග අපේක්ෂකයින් මෙම ප්‍රශ්නයට හොදින් පිළිතුරු සපයා තිබූ අතර ඉහළ ලකුණු ලබාගන්නා ලදී. ඇතැම් විභාග අපේක්ෂකයින්, සුමීගේ වැරදි ක්‍රියාවට අදාලව ASB හවුල් ව්‍යාපාරයේ අනෙකුත් හවුල්කරුවන්ගේ වගකීම පිළිබදව සාකච්ඡා නොකර හවුල් ව්‍යාපාර නීතිය ආශ්‍රිතව, දෙන ලද සිදුවීමේ විවිධ පැතිකඩයන් විශ්ලේෂණය කර තිබිණි. හවුල් ව්‍යාපාරයේ එදිනෙදා ව්‍යාපාර කටයුතු තුල තෝරතයක් (වැරදි ක්‍රියාවක්) සිදුකරන ලද අවස්ථාවක අදාල වැරදි ක්‍රියාව නිසා පාඩුව සිදුවූ පුද්ගලයා සම්බන්ධයෙන් සියළුම හවුල්කරුවන් එක්ව වගකීමට බැදෙන අතර එකී පීඩාවට පත් පාර්ශවයට හවුල් ව්‍යාපාරයේ සියළුම හවුල්කරුවන්ට එරෙහිව, එකට හෝ වෙන් වෙන්ව නඩු පැවරීමට හැකියාව තිබෙන බව අයදුම්කරුවන් හදුනාගත යුතුය.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සදහා අයදුම්කරුවන්ගේ උත්තර සැපයීමේ මට්ටම සතුටුදායක වේ.

## ප්‍රශ්න අංක 08

මෙම ප්‍රශ්නය 2003 අංක 36 දරන බුද්ධිමය දේපල පනතේ ප්‍රකාශන අයිතිය මත පදනම්වී තිබේ. එහි (a) කොටස මගින් 2003 අංක 36 දරන බුද්ධිමය දේපල පනතේ, ප්‍රකාශන අයිතිට වන නීතිය මගින් ආවරණය කෙරෙන දෑ මොනවාද යන්න පැහැදිලි කිරීම සහ (b) කොටසින් දෙන ලද සිදුවීම ආශ්‍රිතව, ප්‍රකාශන අයිතියට වන නීතිය යටතේ වන වගකීම කුමක්ද යන්න විස්තර කිරීම අපේක්ෂා කරන ලදී. බොහෝ අයදුම්කරුවන් ප්‍රකාශන අයිතිය මගින් ආරක්ෂා කෙරෙන දෑ මොනවාද යන්න නිවැරදිව විස්තර කර තිබිණි. නමුත්, සැලකිය යුතු අයදුම්කරුවන් ප්‍රමාණයක් (b) කොටසට නිසි පරිදි පිළිතුරු සැපයීමට අසමත් වී තිබිණි. ඇතැම් අයදුම්කරුවන් දෙන ලද සිදුවීමට අදාලව හුදෙක් කතෘගේ ජීවිත කාලය තුල පමණක් ප්‍රකාශන අයිතිය ආරක්ෂා වන බව වැරදි සහගත අයුරින් සදහන් කර තිබිණි. ප්‍රකාශන අයිතිය කතෘගේ ජීවිත කාලය තුල සහ ඊට අමතරව ඔහුගේ/ඇයගේ මරණයෙන් පසු තවත් වසර 70 කාලයකට ආරක්ෂා වන බව දැනගැනීම වැදගත් වේ.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සදහා අයදුම්කරුවන්ගේ උත්තර සැපයීමේ මට්ටම යම් පමණකට සතුටුදායක වේ.

## ප්‍රශ්න අංක 09

මෙම ප්‍රශ්නය <u>කම්කරු නීතියේ සේවක අර්ථසාධක අරමුදල</u> මත පදනම් වී තිබිණි. මෙහිදී, 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත අනුව, දී ඇති එක් එක් අවස්ථාපිත සාධක යටතේ ඔවුන්ගේ සේවක අර්ථසාධක අරමුදල් ශේෂයන් ලබා ගත හැකිද යන්න හේතු සහිතව පැහැදිලි කිරීම අපේක්ෂා කර තිබිණි. ඇතැම් අයදුම්කරුවන් හුදෙක් සේවකයින්ට ඔවුන්ගේ සේවක අර්ථසාධක අරමුදල් ශේෂයන් ලබා ගත හැකිද නොහැකිද යන්න පමණක් සදහන් කර තිබිණි. මෙම ප්‍රශ්නයේ c කොටස සදහා, ඇතැම් අයදුම්කරුවන්, ආශාට විදේශ රටක කොන්ත්‍රාත් පදනම මත රැකියාවක් ලැබීම නිසා ඇයට සේවක අර්ථසාධක අරමුදලේ ශේෂය ලබා ගත හැකි බවට, වැරදි සහගත අයුරින් සදහන් කර තිබිණි. ඇයට සේවක අර්ථසාධක අරමුදලේ ශේෂය ලබාගැනීමට හැකිවීමට නම්, එම පුද්ගලයා නැවත ශ්‍රී ලංකාවට නොපැමිණෙන බවට සාධාරණ නිගමනයකට එළඹීමට හැකියාව තිබිය යුතු බවට අයදුම්කරුවන් විසින් අවබෝධ කරගත යුතුය.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සදහා අයදුම්කරුවන්ගේ උත්තර සැපයීමේ මට්ටම සතුටුදායක වේ.

## D කොටස

## ප්‍රශ්න අංක 10

මෙම ප්‍රශ්නය කොටස් 02කින් සමන්විත වේ. මෙම ප්‍රශ්නයේ (a) කොටස ගිවිසුම් නීතිය මත පදනම් වී තිබූ අතර (b) කොටස භාණ්ඩ විකිණීමේ ආඥාපනත මත පදනම් වී තිබිණි.

මෙම ප්‍රශ්නයේ a කොටස (i) සඳහා , ගිවිසුම් නීතියේ ගෘහස්ථ ගිවිසුම් වලට අවධානය යොමු කරමින් අමල් සම්බන්ධයෙන් අමාලි සතුව ඇති නෛතික හිමිකම් සාකච්ඡා කළ යුතුය. මෙම කොටසට බහුතරයක් අයදුම්කරුවන් හොඳින් පිළිතුරු සපයා තිබිණි. කෙසේවුවද, ඇතැම් අයදුම්කරුවන් ගිවිසුම් නීතිය සම්බන්ධයෙන් අවධානය යොමු නොකර, පිළිතුර ලෙස හුදෙක් ප්‍රශ්නයේ ඇති කරුණුම පමණක් සඳහන් කර තිබිණි. එකී අයදුම්කරුවන්, දී ඇති සිදුවීම අනුව, අමල් සම්බන්ධයෙන් අමාලි සතුව ඇති නෛතික හිමිකම් පිළිබඳව නිගමනයකට එළඹ නොතිබිණි.

මෙම ප්‍රශ්නයේ (a) කොටස (ii) සඳහා, ගිවිසුම් නීතියේ අර්පණය සඳහා කරනු ලබන ආරාධනා වලට අවධානය යොමු කරමින් සාප්පුහිමියා සම්බන්ධයෙන් අමාලි සතුව ඇති නෛතික හිමිකම් සාකච්ඡා කළ යුතුය. ඇතැම් විභාග අපේක්ෂකයින් මෙම සිදුවීම භාණ්ඩ විකිණීමේ ආඥාපනත සමග පටලවාගෙන තිබූ අතර නොගැලපෙන පිළිතුරු සපයා තිබිණි. සාප්පුවේ ප්‍රදර්ශන කවුළුවේ මිල ලේබලයක් සහිතව භාණ්ඩ ප්‍රදර්ශනය කර තිබීම, අනාගත ගිවිසුමකට එළඹීමේ අරමුණ සහිතව සාකච්ඡා ආරම්භ කිරීම පිණිස වන හුදෙක්, අර්පණය සඳහා කරනු ලබන ආරාධනයක් පමණක් බව අයදුම්කරුවන් විසින් අවබෝධ කර ගත යුතුය.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර සැපයීමේ මට්ටම සතුටුදායක වේ.

මෙම ප්‍රශ්නයේ (b) කොටස මගින්, දෙන ලද සිදුවීම මත පදනම් වී ගැනුම්කරුවෙකු වශයෙන් සිල්වාගේ හිමිකම් සහ ප්‍රතිකර්ම පිළිබඳ සාකච්ඡා කිරීම අපේක්ෂා කරයි. මෙය භාණ්ඩ විකිණීමේ ආඥාපනතට සම්බන්ධය. විකුණුම්කරු විසින් ව්‍යංග කොන්දේසි කඩකිරීම හේතුකරගෙන ගැනුම්කරුවකු වශයෙන් සිල්වාට තිබෙන ප්‍රතිකර්ම විස්තර කිරීමට බොහෝමයක් අයදුම්කරුවන්ට නොහැකි වී තිබිණි. බොහෝ අවස්ථාවන්හි දී, අයදුම්කරුවන් අදාළ නොවන කරුණු ඉදිරිපත් කර තිබූ අතර ඇතැම් අවස්ථාවලදී පිළිතුරු ලෙස ප්‍රශ්නයේ තිබූ කරුණු එනයින්ම නැවත ඉදිරිපත් කර තිබිණි. සමහර අයදුම්කරුවන් මෙම සිදුවීම ගිවිසුම් නීතිය සමග පටලවාගෙන තිබිණි.

සමස්තයක් ලෙස මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර සැපයීමේ මට්ටම සතුටුදායක නොවේ.

\- - -

**විභාග අයදුම්කරුවන්ගේ කාර්යසාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:**

1. නව විෂය කරුණු කෙරෙහි ඉහළ අවධානයක් යොමු කරමින් විෂය නිර්දේශය සම්පූර්ණයෙන් සහ ගැඹුරින් අධ්‍යනය කිරීම.

2. ප්‍රශ්නය කිහිප වරක් කියවීමෙන් අනතුරුව, එමගින් නිශ්චිත සහ ඍජු පිළිතුරු අපේක්ෂා කරනු ලැබ ඇති විට, අනවශ්‍ය පැහැදිලිකිරීම් / විස්තර නොලිවිය යුතුය.

3. කළයුතු ක්‍රියාපද පරීක්ෂා ලැයිස්තුව එහි නිර්වචනයන් සමග ප්‍රශ්නපත්‍රයට අමුණා ඇති අතර වාස්තවික පරීක්ෂණය හැරුණුකොට සෙසු සැම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාපදයක් සමග ආරම්භ වේ. විභාග අපේක්ෂකයින් විසින් ප්‍රශ්නයට පිළිතුරු සැපයිය යුතු වන්නේ කළයුතු ක්‍රියාපද පරීක්ෂා ලැයිස්තුවේ, කළයුතු ක්‍රියාපදයට දී ඇති නිර්වචනය පදනම් කර ගෙනය.

4. විශේෂයෙන් ස්ව-අධ්‍යයන ග්‍රන්ථය, පාඨ ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සගරා සහ මෙම විෂයට අදාල වෙනත් ඕනැම ලේඛනයක් පරිහරණය කරන්න.

5. පිළිතුරු සැපයීමේදී මූලික සංකල්ප සහ න්‍යායන් නිවැරදිව හදුනාගැනීමට සහ සන්සන්දනය කිරීමට අවශ්‍ය වන සක්‍යතාවයන් ගොඩනංවාගන්න.

6. අත්අකුරු වල පැහැදිලිතාවය සහ නිවැරදිව ප්‍රශ්න අංක නිවැරදිව යෙදීම තහවුරු කළ යුතුය.

7. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පිළිපැදීම.

8. පසුගිය ප්‍රශ්න පත්‍රයන්ට සහ පිළිතුරු වලට අවධානය යොමු කරමින් ඔබගේ දැනුම වර්ධනය කර ගන්න.

9. නිසි කාලකළමනාකරණය.

10. පිළිතුරු පත්‍රය භාරදීමට පෙර ප්‍රශ්න අංක නිවැරදිව යොදා ඇත්දැයි නිසි පරිදි පරීක්ෂා කර බලන්න.

11. නිසි පූර්ව සූදානමකින් සහ එය සමත් වීමේ ඒකායන බලාපොරොත්තුවෙන් විභාගයට මුහුණ දෙන්න.

- * * * -